# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2311/43 - 2022 දෙසැම්බර් මස 22 වැනි බ්‍රහස්පතින්දා - 2022.12.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සුරාබදු ආඥාපනත

සුරාබදු නිවේදනය

සංශෝධනය කරන ලද පරිදි සුරාබදු ආඥාපනතේ (52 වන අධිකාරිය වූ) 32 වන වගන්තිය යටතේ මුදල් විෂයභාර අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව නිකුත් කරන ලද සුරාබදු නිවේදන ලෙස ප්‍රකාශයට පත් කළ පහත නියෝගයන්, පහත පරිදි පාර්ලිමේන්තුවේ සම්මත වූ බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

(*අ*) 2021 අගෝස්තු 16 දිනැති අංක 2241/3 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් අවසන් වරට සංශෝධනය කරන ලද පරිදි, 2021 පෙබරවාරි 25 දිනැති අංක 2216/16 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 07/2021 දරන සුරාබදු නිවේදනය සංශෝධනය කරමින් 2021 ඔක්තෝබර් 16 දිනැති අංක 2249/50 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 10/2021 දරන සුරාබදු නිවේදනය, 2022 අප්‍රේල් 20 දින පාර්ලිමේන්තුවේ සම්මත විය.

(*ආ*) 2015 දෙසැම්බර් 31 දිනැති අංක 1947/42 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 986 දරන සුරාබදු නිවේදනය සංශෝධනය කරමින් *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 2260/78 දරන 2022 ජනවාරි 01 දිනැති අංක 01/2022 දරන සුරාබදු නිවේදනය, 2022 අප්‍රේල් 20 දින පාර්ලිමේන්තුවේ සම්මත විය.

(*ඇ*) 2017 දෙසැම්බර් 11 දිනැති අංක 2049/4 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 1004 දරන සුරාබදු නිවේදනය සංශෝධනය කරමින් *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 2260/79 දරන 2022 ජනවාරි 01 දිනැති අංක 02/2022 දරන සුරාබදු නිවේදනය, 2022 අප්‍රේල් 20 දින පාර්ලිමේන්තුවේ සම්මත විය.

(*ඈ*) 2016 මාර්තු 02 දිනැති අංක 1956/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 988 දරන සුරාබදු නිවේදනය සංශෝධනය කරමින් *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 2283/28 දරන 2022 ජුනි 08 දිනැති අංක 04/2022 දරන සුරාබදු නිවේදනය, 2022 නොවැම්බර් 09 දින පාර්ලිමේන්තුවේ සම්මත විය.


**කේ. එම්. මහින්ද සිරිවර්ධන,**
ලේකම්,
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික
ප්‍රතිපත්ති අමාත්‍යාංශය.


2022 දෙසැම්බර් 22 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

EOG 01-1072


1A - G 38522 — 16 (2023/01)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*